සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 S I

**ඉතිහාසය - I** | කාලය පැය 1 1/2

සැලකිය යුතුයි :- • සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
• පහත සඳහන් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.

01. මිනිසා බිහි වීමට නැඹුරුවක් සහිත ලොව බිහිවූ පැරණිම ඇවිදයාමේ හැකියාව සහිත මානවයා හඳුන්වන්නේ කුමන නමකින්ද?

i. චිම්පන්සියා ii. ඔස්ට්‍රලොපිතිකස් iii. නියැන්ඩතාලන්යින් iv. ඔස්ට්‍රලොයිඩ්

02. අතීත මිනිසාගේ සංස්කෘතික දියුණුව සිදුවූ ප්‍රධාන අවධි කීයක් හඳුනාගෙන තිබේද?

i. 03 ii. 04 iii. 05 iv. 06

03. විජය කුමරු ලංකාවට පැමිණෙන විට මෙරට යක්ෂ නමින් හැඳින්වෙන ගෝත්‍රික ජන කොටසක් ජීවත් වූ බවට සඳහන් වන්නේ,

i. චූල වංශයේ ය. ii. දීප වංශයේ ය. iii. බෝධි වංශයේ ය. iv. මහා වංශයේ ය.

04. දඩයම් යුගයේ ජීවත් වූ මෙරට ජනයාගේ ආහාරයක් ලෙස නොගත්තේ පහත ඒවායෙන් කුමක්ද?

i. සතුන්ගේ මස් ii. අල වර්ග iii. වගාකරගත් ධාන්‍ය iv. ගොළුබෙල්ලන්

05. දඩයම් යුගයේ මිය ගිය මිනිසුන්ගේ ඇට සැකිලිවල රතුපාට ආලෝමයක් ආලේප කර ඇති බව සොයාගෙන ඇත. එසේ ආලේපකර ඇත්තේ මොනවාද?

i. රතු ගුරු ගල් ii. රතු පොට්සෝලා පස
iii. රතුපාට සායම් වර්ගයක් iv. ගස් වලින් ලබාගන්නා රතුපාට යුෂ

06. පණ්ඩුකාභය කුමාරයා සරණපාවාගත් කුමාරිකාවගේ නම කුමක්ද?

i. උම්මාද චිත්‍රා කුමරිය ii. ස්වර්ණපාලී කුමරිය iii. අනුලා දේවිය iv. සුගලා දේවිය

07. ලංකාවේ නගරයක් අසල පළමුවරට වැවක් ඉදිකරන ලද්දේ,

i. වසභ රජතුමා ii. ධාතුසේන රජතුමා iii. පණ්ඩුකාභය රජතුමා iv. දේවානම්පියතිස්ස රජතුමා

08. අනුරාධපුරයේ පිහිටා ඇති අභයගිරි දාගැබ ඉදිකරවන ලද්දේ කුමන රජතුමා විසින්ද?

i. දුටුගැමුණු රජතුමාය. ii. දේවානම්පියතිස්ස රජතුමාය. iii. වසභ රජතුමාය. iv. වලගම්බා රජතුමාය.

09. ''වල්ලිපුරම් රන්පත් ඉරුව'' යන ලේඛනයේ ලියා ඇත්තේ කුමක් ගැනද?

i. සිත්තරුබිම් බුදුල්නා ගැනය. iii. ඉසිගිරිය ඇමතිවරයා විහාරයක් ඉදිකල බවය.
ii. ලම්භකරණ රජ වංශය ගැනය. iv. මහසෙන් රජතුමා වැව් දහසක් ඉදිකළ බවය.

10. ටූමන්කාමන් රජතුමා ජීවත් වූයේ කුමන ශිෂ්‍යාචාරයේද?

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේය. iii. හොවැංහෝ ශිෂ්ටාචාරයේය
ii. ඉන්දු නිම්න ශිෂ්‍යාචාරයේය. iv. ඊජිප්තු ශිෂ්ටාචාරයේය.

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා පහත සඳහන් ප්‍රකාශයන් හරිනම් ( ✓ ) ලකුණද, වැරදිනම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

11. ඉතිහාසය පිළිබඳ බොහෝ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍ර වලින් අපට ඉගෙනගත හැකිය. ( )

12. ක්‍රිස්තුස් වහන්සේ උප්පතිය සිදු වීමට පෙර කාලය ක්‍රිස්තු පූර්ව ලෙස හැඳින්වේ ( )

13. අප ජීවත්වන පෘතුවියේ මැද කොටස අධික උෂ්ණත්වයකින් යුක්තය. එය $600C^0$ ක උෂ්ණත්වයකින් යුක්ත වේ. ( )



LIVEWORKSHEETS

14. පෘතුවියේ අභ්‍යන්තරයේ ඇති අධික උෂ්ණත්වයෙන් රත්වී දියර බවට පත්වී තිබෙන උණුසුම් පාෂාණ ''ලාවා'' නමින් හඳුන්වනු ලබයි. ( )

15. මිනිසා ගොවිතැන් කටයුතු කිරීමට නැඹුරුවීමත් සමඟ ගල් ආයුධ හා මෙවලම් වලින් කෘෂිකර්මික කටයුතු කළේය. ( )

**පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16. පෘතුවියේ මුල්ම ජීවියා බිහි වූයේ ............................................ ය.

17. අතීතයේ අප්‍රිකා මහද්වීපයේ ජීවත් වූ ජන වර්ග හඳුන්වනු ලබන්නේ ............................................ ලෙසය.

18. විජය කුමරු ඇතුළු හත් සීයයක් පිරිස ............................................ නම් ජන කොටස අයත්වේ.

19. ලංකාවට බුදු දහම රැගෙන ආවේ කුමණ රාජ්‍ය සමයකද?............................................

20. ලංකාවේ වෙහෙණි සසුන ආරම්භ වන්නේ ............................................ දේවිය පැවිදි වීමෙන් පසුවයි.

(ල.20x2=40)



LIVEWORKSHEETS